# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1782/25 – 2012 ඔක්තෝබර් 31 වැනි බදාදා – 2012.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවාපත්තුව සුළු කොට්ඨාසයේ, පුවක්දණ්ඩාව (අ.ග.පි. 308) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එච්/බීඑල්ල්/2007/378 සහ 2008.03.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1658 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් සහ මායිම් වලින් යුත් ඉඩම් කොටස් දෙක (02):

01. **කැබලි අක්ෂර 'ඒ' – පැරණි ඉංජිනේරු බංගලාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1034**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී සහ මාර්ගය; බටහිරට: ජේ. එල්. පී. අශෝකා රංජනී හිමිකම් කියන පැරණි ඉංජිනේරු බංගලාවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – පැරණි ඉංජිනේරු බංගලාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0624**

උතුරට: කැබලි අක්ෂර ඒ ; නැගෙනහිරට සහ දකුණට: මාර්ගය; බටහිරට: කැබලි අක්ෂර ඒ .

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2007/යූඩීඒ/175.
2012 සැප්තැම්බර් මස 18 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 599